


සිසිර දිසානායක

පසුගිය කාලයේ මෙල්බර්න් නුවර පැවැත්වුණ බොහෝ සිංහල ප්‍රාසාංගික වේදිකාවල ජන ගීයට, ඒ ඇසුරින් කළා වූ නිර්මාණවලට වැදගත් තැනක් හිමි වෙලා තිබුණා. ජන ගී නාද රටා ඇසුරින් නව නිර්මාණ හා ප්‍රතිනිර්මාණ කරමින් සිංහල ජන ගීය අපගේ රසිකයින්ට හුරු කරවීමෙහිලා පුරෝගාමී මෙහෙවරට යෙදෙමින් සිට අප අතරින් වියෝ වූ ලයනල් රන්වලයන්ගේ නිර්මාණවලට ඒ අතර හිමිවූයේ මුල් තැනක්. ඩබ්ලිව්. මකුලොළුව ඇළිරිඳු විසින් ඇරඹූ මෙම මෙහෙවරෙහි මූලිකයින් අතරින් වැඩි වශයෙන්ම රසිකයින් දැන හඳුනා ගත්තේ රෝහණ බැද්දගේ සහ ලයනල් රන්වල ශිල්පීන් බවයි අපගේ හැඟීම. බන්දුල විජේවීර ශිල්පියා සමඟින් එක්ව බැද්දගේ ශිල්පියාණන් යුග ගී ගයමින් වේදිකාවට ප්‍රාසාංගිකත්වය එක් කරද්දී රන්වලයන් සිය අනුගාමික සිසු දරු කැළද සමඟින් වෙනම ම ප්‍රාසාංගික කලාවක් "ගම අවුලක්ඛඳං"

"ඔව් අයියෙ;
පබා ටෙලිනාට්‍යයේ භානුකගේ චරිතය රඟපාන්න ආරාධනා ලැබුණා. ඒ වෙනුවෙනුත් සෑහෙන වෙලාවක් ගත කරන්න වෙනවා."

"තාත්තාගේ සින්දුවක් ගැන කතා කලොත්.......?"

"ගී සඳළුව" වෙනුවෙන් අප හඬ අවදි කළා.

"මම කැමතියි අයියෙ තාත්තාට ජයතිස්ස බොරළුගොඩ මහත්තයා ලියලා දුන්න "හෙළ දිව එක සේසත් කර..." කියන ගීතය ගැන කතා කරන්න. ඇත්තටම තාත්තාගේ ඉල්ලීමකටයි බොරළුගොඩ මහත්මයා මේ ගීතය ලිව්වෙ. වැදි ගී, රබන් ගී ඇසුරු කරගෙන තාත්තා කරපු නව නිර්මාණයකටයි වචන ලිව්වෙ. "

කරනවා........" සහන් නැවතත් මව්බිමේ සිට හඬ අවදි කළා.

"මම තනිවමත් ගායනා කරලා තියෙනවා. තාත්තාගේ අදහස වෙලා තිබුණේ මම තනිවම ගායනා කරපු ගීතය සංගත තැටියට එකතු කරන්න. ඒත් ඉතින් ඊට කලින් තාත්තාට අපෙන් සදහටම වෙන් වෙන්න වුණා. ඒ හන්දා තාත්තා ගායනා කරපු ගීතය තමයි අපි පස්සෙ කාලෙක කරපු "යුද්දෙටත් ඇවිත්" සංගත තැටියට එකතු කළේ."

ගී සඳළුව වෙනුවෙන් අප සහන් රන්වල

**ජෙග ජෙග තක්කට තක්කට තරිකිට**
**ජෙග ජෙග තක්කට තක්කට තරිකිට**
**කුඳ කුඳ කුංකුඳ කුංකුඳ තරිකිට**
**කුඳ කුඳ කුංකුඳ ගතිකුඳ ගතිකුඳ**
**හෙළ දිව එක සේසත් කළ නිරිඳුන්**
**රණ කෙළියට ගිය දා පොරණේ**
**සිව් රඟ සේනා පෙරට ම වැඩියේ**
**දහසක් සිංහල බෙර හඬිනේ**
**බහ තෝරන්නේ - අකුරු කරන්නේ**
**දොරට වඩින්නේ බුදු පුද දී**
**තානම් තම්දෙන දෙපා තබන්නේ**
**සිංහල බෙර පද අගය දැනී**
**උඩරට නැටුමට ගැටබෙර ගන්නේ**
**පහත රටට යක් බෙරය වඩින්නේ**
**සබරගමුව දවුලෙන් හැඩ වෙන්නේ**
**දොම්කිට කුඳගත නැටුම් නටන්නේ**
**දඬුබෙර බුම්මැඩි ඩැක්කි ද සරියේ**
**ඩමරු උඩැක්කි ද දවුල ඉදිරියේ**
**දික් බෙර ඝෝෂක බෙර නොපැකිළියේ**
**තම්මැට්ටම රැව් දෙයි සිත පිරියේ**
**දළඳා පෙරහැර ඔප කරවන්නේ**
**අවුරුදු කාලෙට දොරට වඩින්නේ**
**මගුලෙදි මරණෙදි පෙරමුණ ගන්නේ**
**හැඩ වැඩ කර හෙළ බිම සරසන්නේ**



යෞවන රංගන, ගායන හා නිර්මාණ ශිල්පියාට ස්තූතිවන්ත වුණා.

සිසිර දිසානායක

# හෙළ දිව එක සේසත් කරනවා

ප්‍රසංගය තුලින් වේදිකාවට හඳුන්වා දුන්නා.

පසුගිය නොවැම්බර් දහතුන්වන දා වන විට ලයනල් රන්වලයන් අප අතරින් වෙන් වී වසර 7 ක් ගෙවිලා හමාර වුණා. එතුමන් ගේ ජන්ම දිනය යෙදී තිබෙන්නෙත් නොවැම්බර් මාසයේ 27 දාටයි. ඒ වෙනුවෙන් යමක් කතා බස් කිරීමට මෙවර අප සම්බන්ධ කර ගත්තේ එතුමන්ගේ කනිටු පුත් සහන් රන්වල ශිල්පියාවයි. සිය පියා කරගෙන ආ සත්කාර්යය එතුමන්ගේ වියෝවයෙන් පසුව ඉදිරියට ගෙන යාමේ වගකීම කරට ගත් සහන් අද වනවිට බොහොමත්ම කාර්ය බහුල ශිල්පියෙක්.

"ඔව් අයියෙ; අපේ "ගම අවුලක්ඛඳං" ප්‍රසංග යට තවමත් රසිකයින් ආදරය කරන බව පේනවා. තාත්තාගෙන් පස්සෙ "රන්වල බලකාය" පටන් ගත්තා. "යුද්දෙටත් ඇවිත්" ප්‍රසංගයටත් හොඳ ප්‍රතිචාර ලැබුණා."

දැන් මොනවද අපට කියන්න තියෙන අළුත් තොරතුරු? "සන්නස", "ගී සඳළුව" වෙනුවෙන් අප විමසිලිමත් වුණා.

"අයියා දන්නවත් ඇතිනෙ; අපි වේදිකා නාට්‍යයක් කළා "වෙලාව කීයද?" කියලා. ඊකට ප්‍රේක්ෂකයින් වගේම විචාරකයින්ගේත් හොඳ ප්‍රතිචාර ලැබුණා. ඇත්තටම මේ පාර රාජ්‍ය නාට්‍ය උළලේ අන්තිම වටයට තේරුණ නාට්‍ය පහට "වෙලාව කීයද?" නාට්‍යයත් තේරුණා. ඒ විතරක් නෙමෙයි; "ප්‍රශස්ත සංගීතය" තිර රචනය තුන්වෙනි තැන, හොඳම වේදිකා පසුතල කියන සම්මාන අපට ලැබුණා. චිරන්ත රන්වලව හොඳම සහය නළුවා විදිහට නිර්දේශිත නම් තුනට නම් කෙරුණා. "

"ඇත්තටම අයියෙ මේ නාට්‍යය මං රචනා කළේ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනයේදී නිර්දේශ කෙරුණ පර්යේෂණාත්මක ඉදිරිපත් කිරීමක් විදිහටයි. අපිත් එක්ක තරඟ කරපු අනිත් නාට්‍ය හතර තමයි රාජිත දිසානායකගේ "ආපහු හැරෙන්න බෑ", කේ.බී. හේරත්ගේ "ජගන්මා", සුනිල් චන්ද්‍රසිරිගේ "සිහිනවලට පාට දෙන්න", සංජීව උපේන්ද්‍රගේ "අහිංසකයාගේ ආරාමය". ඉතිං මගේ පළවෙනි උත්සාහයට මෙතරම් දුරකට එන්න ලැබුණ එක ගැන හරිම සතුටුයි."

"අපි පුංචි තිරෙන් දක්ෂකම් දකිනවා මේ දවස්වල......."

ලයනල් රන්වලයන් ගයා රසිකයින් අතර ඉමහත් ප්‍රසාදය දිනූ "මේ අවුරුදු කාලේ" ගීතයේ ගීත නිබන්ධකයායි ජයතිස්ස බොරළුගොඩ සහෘදයා. සබරගමු වන්නම්, බඹර කවි ඇසුරින් රන්වලයන් තනු නිර්මාණය කර සහන් රන්වල ශිල්පියා විසින් ගැයූ "කිරි වඩිනා ගොයම බලා" ගීතයේ ද නිබන්ධකවරයායි ඔහු.

"අපේ නියම සිංහල බෙර අපේ සින්දුවල වාදනය නොවන තරම් විරල කාලයකයි මේ ගීතය ලියවුණේ. තාත්තාට ඕන කරලා තිබුණා අපේ බෙරවල වටිනාකම අපේ අයට වටහලා දෙන්න. ඒ හන්දයි තාත්තා මේ විදිහට ගීතයක් ලියලා දෙන්න කියලා ඉල්ලුවෙ. ඇත්තටම "ඩ්‍රම් කිට්" එක වගේම තබ්ලා කුට්ටමත් අපේ දේවල් නෙවෙයිනෙ අයියෙ........" සහන් පැවසුයේ හැඟීම්බරව.

"මට මතකයේ හැටියට මේක කෙරුණේ 1995-96 විතර. ඒ දවස්වල ටී.එම්. ජයරත්න මහත්මයා එහෙමත් මේ ගායනාවලට සම්බන්ධ වුණා. 2000 සහශ්‍රකය උදාවෙන වෙලාවෙ කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ තිබුණ උත්සවයට අපි ඉදිරිපත් කළේ මේ ගීතය. "උඩරට නැටුමට ගැටබෙර ගන්නේ" කියලා පටන් ගන්න කොටසේ පදයෙන් පදයට ඒ ඒ බෙරවලින් පදයක් වාදනය කරමු කියලා යෝජනා කළේ මම. තාත්තා ඒත් ටිකක් අදිමදි කළා රිද්මය බිඳෙනවා නේද කියලා. ඒත් ඒ ඒ බෙර වාදනය වෙන හැටි, ඒ ඒ පද, ඒ ඒ බෙර හඬවල් ගැන අවබෝධයක් ලැබෙනවා නේද ඒ විදිහට ඒ වාදන ඇතුලත් කරපු නිසා ? " සහන් දුරකථනයේ එහා කෙළවර සිට ඇසුවා.

උඩරට, පහතරට හා සබරගමු යන ප්‍රධාන නැටුම් සම්ප්‍රදායන් තුන මූලික කොටගෙන එම කොටසේ දී එකී හේවිසි වාදන ඉදිරිපත් වූ වා සේම අනෙක් භාණ්ඩයන් වන තම්මැට්ටම, උඩැක්කිය, උණ ලීය වැනි දේ ද ගැට බෙර, යක් බෙර හා දවුල්වලට අමතරව මෙම ගීයේදී වැයෙනවා. සහන් රන්වල ශිල්පියාගේ සමකාලීන ආදී ආනන්දයීයෙකු වූ ජනනාත් වරකාගොඩ ශිල්පියාගේ හේවිසි වාදන සහායද ගීය වඩාත් අලංකාරවත් වීමට හේතු වූ බව අමතක කළ යුතු නෑ.

"මේ ගීතයේ කොටසක් මමත් ගායනා

18 වන පිටුවෙන් (මගේ එකම අරමුණ)

Hospitality, Automotive, Workplace Assessment Training වැනි පාඨමාලා ආරම්භකරනවා.

*ඔබ මට මුලින්ම මුණගැසුණේ ගායකයකු ලෙස "මෙපුර ගී" ප්‍රසංගයේදී. ඔබේ ගායන දිවිය ගැන යමක් කතා කරමුද?*

මම සංගීතයට ඉතාමත් ලැදි පුද්ගලයෙක්. ශ්‍රී ලංකාවෙදිත් මෙහෙදිත් විවේක ලද හැම මොහොතකම අපි ගීත ගයා විනෝද වන්නට පුරුදුව හිටියා. ඒ අනුව මට හිතුණා ගීත කීපයක් ගායනා කරන්නට. වෘත්තීය ගායකයකු වන්නට නෙවෙයි. මගේ ආසාවට. මම ශ්‍රී ලංකාවට යන හැම මොහොතකම අලුත් ගීතයක් දෙකක් ගායනා කර පටිගත කරගන්නවා. දැනට ගීත 10ක් පමණ නිර්මාණය කොට තිබෙනවා. මෙයින් ගීත 6ක්ම පද රචනා කළේ නොයෙල් පෙරේරා. සංගීතවත් කළේ රෝහණ වීරසිංහ.

මෙයින් ගීත 3 ක රූප රචනා කර තිබෙනවා. මේ ගීත සඳහා දිල්හානි අසෝකමාලාත් ජීවන් කුමාරණතුංගත් රංගනයෙන් දායකත්වය සපයා තිබෙනවා.

*"ඒර්ජ් සින්ගිං ස්ටාර්" තරඟය ආරම්භ කරන්න හිතුවෙ ඇයි?*

ඔස්ට්‍රේලියාවෙ තමයි අනිත් රටවල් වලට සපේක්ෂව වැඩිම ශ්‍රී ලාංකිකයන් පිරිසක් ජීවත් වන රට. ඒ වගේම විශාල දක්ෂතා තිබෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිරිසකුත් මෙහි සිටිනවා. මේ අයගේ දක්ෂතා ඉදිරියට ගෙන ඒම මගේ මූලික අරමුණයි. මේ තරඟය ආරම්භ කළේ ඒ සඳහායි.

*මේ තරඟයේ ස්වභාවය ගැන අපට විස්තරයක් කරන්න පුලුවන් ද?*

මුලින්ම මේ ගැන දැනුවත් කිරීමෙන් අනතුරුව අපට විමසීම් 300 - 400 ක් පමණ ලැබුණා. එයින් මූලික වටයට 100 කට වැඩි ප්‍රමාණයක් සහභාගි වුණා. ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් විසින් දෙවන වටය සඳහා 35 දෙනකු තෝරා ගනු ලැබුවා. තෙවෙනි වටයට 17 දෙනකු සුදුසුකම් ලැබුවා. එයින් 6 දෙනෙක් තෝරා ගෙන ඔවුන් අතරින් හොඳම ගායකයා හෝ ගායිකාව තෝරා ගන්නවා. අවසන් වටයේ 6 දෙනාට දෙසැම්බර් 19 වනදා සැන්ඩවුන් රේස් පිටියේදී පැවත්වෙන සමර් බ්‍රීස් ප්‍රසංගයේදී සමන් ද සිල්වා නිරෝෂා විරාජිනී මරියසෙල් ගුණතිලක සුරේන්ද්‍ර යන ගායන ශිල්පීන් සමග එකම වේදිකාවේ ගීත ගායනා කරන්නට අවස්ථාව ලැබෙනවා. ඒ විතරක් නෙවෙයි ශ්‍රී ලංකාවේ තිබෙන ජනප්‍රිය ආයතනයක් වන ට්‍රිපල් එස් ඉවෙන්ට්ස් මැනේජ්මන්ට්ස් ආයතනය සමග එකතු වී සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී දැවැන්ත සංගීත ප්‍රසංගයකට සහභාග වන්නටත් ඔවුන්ට අවස්ථාව ලැබෙනවා.

මගේ තවත් බලාපොරොත්තුවක් තිබෙනවා මේ තරගයෙන් මතුවන දක්ෂයන් එක්කොට සංගීතමය නාට්‍යයක් කිරීමටත්. එයත් ඔවුන්ට නැවුම් අත්දැකීමක් වේවි.

*මේ ප්‍රසංගය මෙහෙට විතරද සීමාවෙන්නෙ*

නෑ. දැනටම අපට සිඩ්නි වලින් ඇරයුම් ලැබිලා තියෙනවා මෙම තරගය සිඩ්නි වලත් සංවිධානය කිරීමට බලාපොරොත්තු වෙනවා.

නවක ගායක ගායිකාවනට සිය දස්කම් දක්වා ඉදිරියට ඒමට අත හිත දෙන සමර් බ්‍රීස් ප්‍රසංගය ඉතා සාර්ථක ලෙස පැවැත්වීම ඩිල්ෂාන්ගේ අපේක්ෂාවයි. ඔහු මේ වෙනුවෙන් සිය කාලය ධනය හා ශ්‍රමය මහත් ලෙස වැය කර ඇති බව අපට පෙනෙයි. අපේ තරුණ තරුණියනට අත හිත දීමටත් ඔවුන්ගෙ දක්ෂතා අගයන්නටත් ප්‍රවීණ ගායන ශිල්පීන් සමග ඔවුන් දක්වන දස්කම් නරඹන්නටත් අප සැම සමර් බ්‍රීස් ප්‍රසංගය නැරඹිය යුතුමය.